# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## ①

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය
## ව්‍යවසායකත්වය

**(1) පහත ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණද ඉදිරියෙන් දී ඇති කොටුවේ සටහන් කරන්න.**

1. ව්‍යවසායකයා අලුත් අදහස් හා සංකල්ප ක්‍රියාවට නැංවීමට උත්සාහ දරයි
2. ඉහළ ප්‍රතිලාභ පමණක් අපේක්ෂා කිරීම ව්‍යවසායකයාගේ ලක්ෂණයකි.
3. ව්‍යවසායකයා අනාගත ලෝකය වෙනස් කිරීමට දායක වේ.
4. බාධක හමුවේ නම් නිර්මාණාත්මක අදහස් ක්‍රියාවට නැංවීමට ව්‍යවසායකයා මැලිකමක් දක්වයි.
5. පුද්ගල හැසිරීම් තුළින් ව්‍යවසායකත්වය හඳුනා ගත හැකිය.
6. මිනිරන්, භූමිය යන නිෂ්පාදන සාධකයට උදාහරණයකි.
7. ප්‍රාග්ධනය යනු මුදල් පමණි.
8. ව්‍යාපාර සාර්ථක හෝ අසාර්ථක වීම අවදානම ලෙස හැඳින්වේ.
9. තේ කම්හලක සේවකයෙකුගේ සේවය, ශ්‍රමය යන නිෂ්පාදන සාධකයට අයත් නොවේ.
10. ගතික යන්නෙන් අදහස් වන්නේ නිතර වෙනස් වන සුළු බවයි.
11. සෑම නවෝත්පාදනයක්ම බිහි වන්නේ ගැටළුවකට විසඳුමක් ලෙසයි.
12. සෑම සාර්ථක ව්‍යාපාරිකයෙකුම අවදානම් රහිත ව්‍යාපාරික අවස්ථා තෝරා ගනී.
13. යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම නිර්මාණශීලීත්වයට බාධාකාරී සාධකයකි.
14. වඩුවැඩ කර්මාන්තයේ නියැළීම කාන්තාවකට නුසුදුසු යයි ව්‍යවසායකයා සිතයි.
15. ව්‍යාපාරික අවස්ථා ආදිය පිළිබඳ විමසිලිමත් වෙමින් නව ව්‍යාපාර කටයුතු සිදු කිරීම පරිසර සංවේදී බවයි.
16. නිර්මාණාත්මක අදහස් වල ප්‍රතිඵල සාර්ථක හෝ අසාර්ථක විය හැකිය.
17. නව සොයා ගැනීම් වලට මූලික හේතුව කුතුහලයයි.
18. නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම තුළින් නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකිය.
19. පවතින සංකල්පයකට සමාන ව නිපදවූ නව නිර්මාණයක් , දිගුවක් ලෙස හඳුන්වයි.
20. අනපේක්ෂිත සිදුවීම් නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි.
21. අවදානමට ප්‍රධාන හේතුව අවිනිශ්චිතතාවයි.
22. අවදානම ඉහල නම් ප්‍රතිලාභ පහල වේ.
23. ඔට්ටුකරුවන් සාර්ථක ව්‍යවසායකයින් නොවේ.
24. යම් යම් අරමුණු හා ඉලක්ක ගොඩ නගා ගැනීමෙන් අනාගතය සාර්ථක කර ගැනීමට නොහැකිය.
25. ව්‍යවසායකයෙකු අනාගතය පිළිබඳ සොඳුරු සිතුවම් දැකීම, අසාර්ථකත්වය, පරාජය හා අභියෝග යහපත් ලෙස දැකීම සුභවාදී වීම ලෙස හඳුන්වයි.

26. **A** ලැයිස්තුවට ගැලපෙන වචන **B** ලැයිස්තුවෙන් තෝරා දී ඇති හිස් තැනෙහි අදාල අංක ලියන්න.

**A**

a. ව්‍යවසායකත්ව මූලික ගති ලක්ෂණ ......................
b. ගැටලු ......................
c. නවෝත්පාදන සිදුවන ආකාර ......................
d. නම්‍යශීලීත්වය ......................
e. නවෝත්පාදන සඳහා පදනම් වන මූලාශ්‍ර ......................
f. විසඳුම් ......................
g. දැක්ම ......................
h. ව්‍යවසායකයෙකුගේ සාමාන්‍ය ගති ලක්ෂණ ......................

**B**

1. ජපන් ජබර ශාකය යොදා කොම්පෝස්ට් නිෂ්පාදනය
2. නව සොයා ගැනීමක්
3. පරිසරයේ වෙනස්වීම් වලට උචිත පරිදි අනුගත වීමට ඇති හැකියාවයි
4. තැන තැන දමා යන ප්ලාස්ටික් අපද්‍රව්‍ය
5. අනාගතයේදී ව්‍යාපාරය කුමන මට්ටමක පවතීද යන අවබෝධය
6. නිර්මාණශීලීත්වය
7. ආත්ම විශ්වාසය
8. වැව්වල ඉතා සීඝ්‍රයෙන් වැවෙන ජපන් ජබර ශාකය
9. අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව
10. ස්වයං පෙළඹවීම
11. සංකලනයක්
12. ප්‍රතිචක්‍රීකරණය මඟින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය
13. අනපේක්ෂිත සිදුවීම්
14. ස්වාධීනත්වය
15. වෙළෙඳපොලේ වෙනස්වීම්

**(2) වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) ව්‍යවසායකත්වය යනු,

1. සමාජයට යහපතක් කරමින් හොඳ ජීවිතයක් ගත කිරීමයි.
2. පුද්ගලයා සිතන හා තර්ක කරන ආකාරයයි.
3. ව්‍යාපාරිකයෙකු ව්‍යාපාරය මෙහෙය වන ආකාරයයි.
4. පරිසරයේ ඇති ව්‍යාපාරික අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුලින් නවෝත්පාදන බිහි කිරීමේ යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ ක්‍රියාවලියයි.

2) ව්‍යවසායකයා යනු,
   1. ව්‍යාපාර කටයුතු වල යෙදෙන පුද්ගලයා වේ.
   2. ව්‍යාපාර අයිතිකරු වේ.
   3. සැලසුම් සකස් කිරීම හා නිවැරදි තීරණ ගැනීම ඔස්සේ ආර්ථික සමාජීය පරිවර්තනයට දායක වන්නෙකි.
   4. සියලු බාධක අභිබවා තම මතය ජය ගන්නා තුරු කාර්යයයේ නිරත වන්නෙකි.

3) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා ප්‍රධාන සාධක,
   1. 3කි
   2. 4කි
   3. 5කි
   4. 10කි

4) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය,ව්‍යවසායකත්වය යනු,
   1. ස්වභාවික සම්පත්ය.
   2. නවෝත්පාදනයන්ය.
   3. නිෂ්පාදන සාධකයන්ය.
   4. ව්‍යවසායකත්ව ගති ලක්ෂණයන්ය.

5) ඉඩම් යන නිෂ්පාදන සාධකය අයත් වන්නේ
   1. භූමියට ය.
   2. ශ්‍රමයට ය.
   3. ප්‍රාග්ධනයට ය.
   4. ව්‍යවසායට ය.

6) ප්‍රාග්ධනය ලෙස අදහස් වන්නේ,
   1. සියලු ස්වභාවික සම්පත්ය.
   2. සියලු භෞතික සම්පත්ය.
   3. සියලු නිෂ්පාදන සාධක ය.
   4. සියලු භාණ්ඩ හා සේවා ය.

7) නිෂ්පාදන සාධක මෙහෙයවමින් භාණ්ඩ හා සේවා නිපදවීම, බෙදා හැරීම ආදිය සිදු කරන්නේ,
   1. ව්‍යාපාර අයිතිකරුය.
   2. ව්‍යාපාර කළමනාකරුය.
   3. ව්‍යාපාර සේවකයන්ය.
   4. ව්‍යාපාර ව්‍යවසායකයන්ය.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

8) අපතේ යන දේවල් වලින් සිදු කරන නවෝත්පාදනයක් **නොවන්නේ,**

1. නිවසේ එකතු වන කුණු රොඩු පුළුස්සා දැමීම.
2. ඉවත ලන කඩදාසි ආශ්‍රයෙන් කඩදාසි බෑග් නිෂ්පාදනය.
3. ඇඟලුම් කම්හලක ඉවතලන රෙදි කැබලි භාවිතයෙන් පාපිසි නිෂ්පාදනය.
4. බීම බට යොදා ගෙන විසිතුරු නිර්මාණ කිරීම.

9) නවෝත්පාදන සිදු වන ආකාරයක් **නොවන්නේ,**

1. සංකලනයක්
2. දිගුවක්
3. අනපේක්ෂිත සිදුවීමක්
4. නව සොයා ගැනීමක්

10) අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධයක් නැත.
2. අවදානම ඉහල නම් ප්‍රතිලාභය පහලය.
3. අවදානම පහල නම් ප්‍රතිලාභය ද පහලය.
4. අවදානම් නම් කිසිදු ප්‍රතිලාභයක් නැත.

11) උපතින්ම දෙපා අහිමි ජෙසිකා කොක් ගුවන් නියමු වරියගේ සාර්ථකත්වය තුලින් පිළිඹිබු වන ව්‍යාවසායකත්ව ගති ලක්ෂණය වන්නේ,

1. අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව
2. පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම.
3. ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට ඇති විශ්වාසය.
4. නවෝත්පාදන කෙරෙහි ඇති උනන්දුව

12) අන් අයගේ මත වලට ගරු කිරීමත්, ඒවා පිළිගැනීමත් කරනු ලබන ව්‍යාවසායකයා සිය තීරණ වලට එළඹීමේදී නිදහස්ව සිතීමට ප්‍රිය කරයි. මෙම ගති ලක්ෂණය,

1. නම්‍යශීලීත්වයයි.
2. සුබවාදී බවයි.
3. ස්වාධීන බවයි.
4. අසීරු අරමුණු ඉටු කර ගැනීමයි.

13) “මම අසාර්ථක නොවූවෙමි. නමුත් විදුලි බුබුල ක්‍රියා විරහිත විය හැකි අවස්ථා නවසිය අනූ නවයක් හඳුනා ගත්තෙමි.” මෙම ප්‍රකාශය කරන ලද්දේ,

1. අයිසෙක් නිව්ටන්
2. ජෙසිකා කොක්
3. තෝමස් අල්වා එඩිසන්
4. නික් වුයිජිසික්

14) ගනුදෙනුකරුවන් පෝලිම් වල සිටීමට අකමැති බව දැනගත් ව්‍යවසායකයෝ ඔවුන්ගේ පහසුව තකා ස්වයං සේවා වෙළෙඳසැල්, අන්තර්ජාල වෙළෙඳසැල්, විද්‍යුත් ගෙවීම් වැනි නවෝත්පාදන හඳුන්වා දුන්හ. මෙම ව්‍යවසායකත්ව ගති ලක්ෂණය,

1. ස්වාධීනත්වයයි.
2. නිර්මාණශීලීත්වයයි.
3. නම්‍යශීලීත්වයයි.
4. ස්වයං පෙළඹවීමයි.

15) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. අවදානම් භාර ගැනීම, ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම, නිර්මාණශීලීත්වය.
2. ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම, නිෂ්පාදන සාධක භාවිතා කිරීම, ස්වාධීනත්වය
3. ගැටලු අභියෝග ලෙස දැකීම, අනුකරණය කිරීම, නවෝත්පාදන බව.
4. නවෝත්පාදන බව, නම්‍යශීලීත්වය, අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව.

16) ව්‍යවසායකයෙකු තුල පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණයකි.

1. තොරතුරු සොයා බැලීම.
2. අනාගත දැක්ම.
3. පරිසර සංවේදී බව.
4. සුබවාදී වීම.

17) අන් අය මත නොරැඳී තමා තමාගේ ස්වාමියා ලෙස සැලකීම

1. කැපවීම යි.
2. දැඩි ආශාවයි.
3. ආත්ම විශ්වාසයයි.
4. සාමාන්‍ය වැටහීමයි.

18) කොවිඩ් 19 ව්‍යවසනය නිසා මාර්ගගත අධ්‍යාපනයට ඇති නැඹුරුකම වැඩි වී ඇත.මෙය,

1. ක්‍රියාවලි අවශ්‍යතාවය හේතුවෙන් සිදු වූ වෙනස්කමකි .
2. සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම නිසා සිදු වූවකි.
3. ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ ඇති වූ වෙනස් වීමක ප්‍රතිඵලයකි.
4. පර්යේෂණ හා අත්හදා බැලීම් වල ප්‍රතිඵලයකි.

## (3) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. ව්‍යවසායකත්වය යන්න නිර්වචනය කරන්න.
2. ව්‍යවසායකයා යනු කවුරුන්ද?
3. ව්‍යවසායකත්වය නිෂ්පාදන සාධක වල ඇති සුවිශේෂීම සාධකය වන්නේ ඇයි?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන සේවාව

4. ව්‍යවසායකයෙකුගේ කාර්යයන් 02ක් ලියන්න.
5. ප්‍රධාන නිෂ්පාදන සාධක නම් කරන්න.
6. නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමය යන්න නිර්වචනය කරන්න.
7. ප්‍රාග්ධනය සඳහා නිදසුන් 03ක් නම් කරන්න.
8. ව්‍යවසායකයා විසින් ගනු ලබන නිෂ්පාදන තීරණ සඳහා නිදසුන් 03ක් ලියන්න.
9. ඔබ ඉගෙන ගත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ වලින් 04ක් නම් කරන්න.
10. ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් ලෙස අනාගත දැක්ම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?
11. නිර්මාණශීලීත්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?
12. පරිසර සංවේදී පුද්ගලයෙකු ලෙස ඔබ ජීවත් වන සමාජයේ හඳුනාගත් ගැටලු 03ක් හා ඒවාට විසඳුම් ලෙස යෝජනා කරන කරුණු 3ක් ලියන්න.
13. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක කවරේද?
14. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක හඳුනා ගැනීම කළ හැකි නම්, ඒවා අවම කොට නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ව්‍යවසායකයාට හැකියාව ලැබේ. ඒ අනුව නිර්මාණශීලිත්වය වර්ධනය කර ගත හැකි ක්‍රියාමාර්ග 04ක් ලියන්න.
15. පහත එක් එක් කරුණට අදාල නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි ක්‍රියාමාර්ගය හෝ නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකය ලියන්න.

   a. දේවක රැකියා විරහිත තරුණයෙකි. ඔහු එළවළු වගාවක් ආරම්භ කළ අතර කොවිඩ් වසංගත ය හේතුවෙන් ඉන් ලබා ගත හැකි වූයේ සුලු ආදායමකි. එහෙත් ඉන් කම්පා නොවූ ඔහු ඒ වෙනුවට කහ වගාව පටන් ගත්තේය. මේ දිනවල කහ අස්වනු නෙලන දේවක ඉතා ඉහළ ආදායමක් ලබයි. .......................................................

   b. වර්තමානයේ ඉහළ ඉල්ලුමක් ඇති CCTV කැමරා සවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන කිලේෂ් ඒ සඳහා ඔහු තුළ ඇති තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවන බව විශ්වාස කරයි. එම නිසා තුන් මාසික CCTV කැමරා සවි කිරීමේ පාඨමාලාවක් හැදෑරීමට අදහස් කරයි. .....................................................

   c. DDI සමාගමේ නිර්මාතෘ උදය ජීවන්දර මහතාගේ ගුණානුස්මරණ උළෙලකදී පැවැත්වූ දේශනයකින් කියවුනේ එම සමාගම අද පවතින දියුණු තත්වය කරා ගෙන ඒමේදී ඔවුන් මුහුණ දුන් මිහිරි හා අමිහිරි අත්දැකීම් ගැනයි. මේ දේශනයට සවන් දුන් ලී කැටයම් ශිල්පියෙකු වූ ගාමිණී තම ව්‍යාපාරයද අනාගතයේ දියුණු මට්ටමක තිබිය යුතු යැයි තරයේ විශ්වාස කරයි. ....................................................

   d. වඩු කාර්මිකයෙකුගේ දියණියක වූ උපමාලිට ලී බඩු සෑදීම පිළිබඳ තිබුණේ ඉතා ඉහළ දක්ෂතාවයකි. සහජයෙන් හිමි වූ එම දක්ෂතාවය ඇය වැඩි දියුණු කර ගත්තේ විවේක වේලාවන්හිදී තම පියාගේ වැඩ වලට උදව් වීමෙනි. හදිසියේ රෝගාතුර වූ පියාට මෙම කර්මාන්ත කිරීම තව දුරටත් අපහසු විය. කාන්තාවක් වීම නිසා වඩු වැඩ කිරීම එතරම් නුසුදුසු බව උපමාලි කල්පනා කරයි. ටික දිනකින් ඔවුන්ගේ වඩු වැඩපල වැසී යන තත්වයට පත් විය. ...............................................

ඉ. බේරුවල ප්‍රදේශයේ ජීවත් වන සුගතපාල මාළු විකිණීමෙන් ජීවනෝපාය සරි කර ගත් අයෙකි. ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයට මුහුණ ලා ඔවුන්ගේ නිවස පිහිටා ඇත. ඉවුම් පිහුම් කටයුතු මැනවින් දන්නා ඔහුගේ බිරිඳ රෑ කඩයක් විවෘත කළ අතර උපයන ආදායම ප්‍රමාණවත් නොවේ යැයි පවසා මාසයකින් පමණ පසු කඩය වසා දැම්මේය. ................................................

16. පහත හිස්තැනට වඩාත් ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.
(නවෝත්පාදනය, සංකලනය, අවදානම, ප්‍රතිලාභය , සාමාන්‍ය වැටහීම)

1) නිර්මාණශීලී අදහස් ප්‍රයෝජනවත් දෙයකට පරිවර්තනය කිරීම ................................. මගින් සිදුවේ.
2) ව්‍යවසායකයා නවෝත්පාදනයේ යෙදෙන විට එහි ......................................තක්සේරු කරයි.
3) නවෝත්පාදන සිදු වන ආකාරයක් වන්නේ...................................යි.
4) ව්‍යාපාරයක් වෙනුවෙන් යොදන මුදල සඳහා ප්‍රමාණවත්..........................ක් ලැබේ දැයි නිශ්චිතව කිව නොහැක.
5) .................................ව්‍යවසායකයන් තුළ පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණයකි.

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

17. නවෝත්පාදනයේ යෙදෙන ව්‍යවසායකයා අවදානමක් දරයි. ඔබ මේ ප්‍රකාශය හා එකඟ වන්නේද? හේතු දක්වන්න.
18. අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධය ලියන්න.
19. නවෝත්පාදන සිදුවිය හැකි ආකාර ලියා ඒ සඳහා උදාහරණ 2 බැගින් ලියන්න.
20. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයක් ලෙස වෙළෙඳපොල වෙනස්වීම් හැඳින්විය හැකිය. වෙළෙඳපොල වෙනස් වීම් නිසා සිදු වී ඇති නවෝත්පාදන 2ක් ලියන්න.
21. තම සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය නොපෙනෙන බලවේග වලට භාර නොදුන් දෙපා අභිමි ගුවන් නියමුවරිය කවුද?
22. ව්‍යවසායකයා තුළ පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණ 03ක් ලියන්න.

**(4)** **පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

මගේ ගම අඟුණකොළපැලැස්ස. මාගේ තාත්තා ගොවියෙක්. අපි වගා කළේ මිරිස්. සමහර කාලවලට මිරිස් විකුණල අපි හොඳ ආදායමක් ගත්තා. ඒත් සමහර කාලවලදී ලැබෙන ආදායම හුඟක් අඩුයි. මම උසස් පෙළ අවසන් කළාට පස්සෙ මට හිතුන ආදායම අඩු කාලෙදි මිරිස් වේලන්න. වියළි මිරිස් වගාවට හොඳ ඉල්ලුමක් තියෙනවා. ඒවාට ස්ථාවර මිලක් තියෙනවා. ඉතින් අපේ ආදායම වෙනදට වඩා හොඳ වුනා. මට විශ්ව විද්‍යාලෙ යන්න ලකුණු මදි. ඉතින් වෙන රැකියා වලට අයදුම් කළත් ඒවායේ පොරොන්දු වුන වැටුප මට ප්‍රමාණවත් නැ කියල හිතුණා. පවුලේ අයත් සමඟ සාකච්ඡා කරල අපි අපේම මිරිස් කුඩු සකස් කිරීමේ ව්‍යාපාරයක් පටන් ගත්තා.මේ ව්‍යාපාරය සාර්ථක කර ගන්න පුළුවන් කියන දැඩි විශ්වාසය වගේම මෙම ව්‍යාපාරය සාර්ථක කර ගන්න මට දැඩි ආශාවකුත් තිබුණා. අපේ මිරිස් මිලදී ගන්නන්ගෙන්

මට හොඳ සහයෝගයක් ලැබුණා. නිතරම ඔවුන් සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් මට අවශ්‍ය තොරතුරු ලබා ගන්නත් මට හැකි වුණා.

2018 වර්ෂයේ මම “chili” නමින් මිරිස් කුඩු පැකට් කිරීමේ ව්‍යාපාරයක් පටන් ගත්තා. මගේම ත්‍රී රෝද රථයෙන් ඒවා අවශ්‍ය අයට බෙදා හැරීම් කළා. සති 2 ක ණය සහන කාලයක් කඩ හිමියන්ට ලබා දීම නිසා ඔවුන් මාගේ මිරිස් කුඩු වැඩිපුර ගන්න පෙළඹුනා. කියන්න සතුටුයි. මගේ ආදායම වෙනදාට වඩා ඉහල යමින් තිබුණා. මගේ පියාගේ නමින් බැංකු ගිණුමක් විවෘත කරල හැම සති 2කට වරක් රු.5000 ගානේ බැංකුවෙ තැන්පත් කලේ අනාගතයේ අපේ ව්‍යාපාරය දියුණු කර ගන්න අවශ්‍ය මුදල් එකතු කර ගන්න. මම හැම විටම හිතුවේ මේ ව්‍යාපාරයේ දියුණුව සහ අපගේ දියුණුව. සමහර වේදනාකාරී අත්දැකීම් නැතුවාම නෙවි. ඒත් මම සුභවාදී වුනා. මම මගේ උත්සාහය පිළිබඳව විශ්වාස කළා. ඒ විශ්වාසය තමයි මාව මෙම ස්ථානය වන තුරු රැගෙන ආවේ. අද වන විට මගේ ව්‍යාපාරයේ මිරිස් කුඩු වලට අමතරව පොළොස් හා මස් ව්‍යාංජන රසවත් කිරීමට යොදා ගත හැකි කුළු බඩු සංයෝගයකුත් නිෂ්පාදනය කරනවා. ඒකට අපේම වගාවෙන් මිරිසුත්, අනෙක් තුනපහ සැපයුම්කරුවන්ගෙනුත් මිලදී ගන්නවා. තුනපහ නිෂ්පාදනය හා සම්බන්ධ පුහුණු වැඩසටහනකට ද මා සම්බන්ධ වී මට අවශ්‍ය දැනුම ලබා ගත්තා. මීට අමතර 2020 වර්ෂයේ දකුණු පලාතේ නැගී එන කුඩා පරිමාණ ව්‍යවසායකයාට හිමි සම්මානය පවා මට හිමි වුණා. එයට අමතරව රු.2 000 000/- ක මුදල් ත්‍යාගයක්ද මට ලැබුණා. මේ සියලු දේ තුලින් මම මගේ ව්‍යාපාරය තවත් ඉහළට ගෙන යාමට උත්සාහ කරනවා. ඒ තුලින් මට මෙන්ම මගේ ගමට ද සේවය කිරීම මගේ අධිෂ්ඨානයයි.

1. මෙහි සඳහන් ව්‍යවසායකයා සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 4 ක් ලියන්න.
2. මෙහි සඳහන් නවෝත්පාදන සිදු වන ආකාරයක් ලියා උදාහරණ ලියන්න.
3. නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි සාධක මෙහි සඳහන්වේ. ඒවා 2ක් ලියන්න
4. ව්‍යවසායකයෙකු තුල පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණ මෙහි දක්වා ඇත.
   ඒවා මොනවාද?
5. මෙම ව්‍යාපාරයට සුදුසු දැක්මක් යෝජනා කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව